# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 251/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 11/02/2024 පැය 1955

## මාධ්‍ය නිවේදනය

**නිවසක් බිඳ දේපල සොරා ගැනීමට තැත්කල සැකකරුවෙකුට පහරදී ඝාතනය කිරීමක් - මිනුවන්ගොඩ පොලිස් වසම.**

2024.02.11 වන අද දින අළුයම් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ යාගොඩමුල්ල, කොටුගොඩ ප්‍රදේශයේ නිවසකට ඇතුළු වූ පුද්ගලයින් තිදෙනෙකු විසින් නිවසේ තිබූ දේපල සොරා ගැනීමට තැත් කිරීමේදී එම නිවැසියන්ගේ සහායට පැමිණි පුද්ගලයෙකු විසින් ඔවුනට තියුණු ආයුධයකින් පහරදී ඇත. එහිදී එක් පුද්ගලයෙකු එම නිවස තුළදීම මියගොස් ඇති අතර අනෙක් දෙදෙනා පලාගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වන සමෘද්ධිගම, කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධිය වන අවස්ථාවේ නිවසේ හිමිකරු ව්‍යාපාර කටයුත්තක් සඳහා අළුයම නිවසින් පිටව ගොස් සිට ඇති අතර, නිවසේ මව සහ දියණියන් සිව් දෙනා පමණක් සිට ඇත. සැකකරුවන්ට පහරදුන් පුද්ගලයා එම නිවසට නිතර යන එන අසල පදිංචි හිතවත් පුද්ගලයෙකු බවටත් දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පලා ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මිනුවන්ගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**